භාෂාව හා එයින් හැඩගැස්වෙන සමාජයේ චින්තනය පිළිබඳවත්, ඒ සඳහා මාධ්‍ය වෙතින් ලැබෙන දායකත්වය පිළිබඳවත් අප නැවත නැවතත් කථාබස් කොට ඇත. ඇතැම් විටක අතීතයේදී භාවිතා වූ යම් යම් යෙදුම් පවා, වර්තමානයේදී අනුචිත, අයෝග්‍ය බවට පත්වී තිබේ.

පුවත්පත් තුළ ඇතැම් විට භාවිතා වන "මෙහෙකාරිය" වැනි යෙදුම් මීට උදාහරණ ලෙසින් දැක්විය හැක. මෙවන් යෙදුම් ඔස්සේ වර්තමානයේ පවත්නා සේවානියුක්ත-සේවායෝජක සම්බන්ධතාවයට වඩා ස්වාමි-සේවක සම්බන්ධතාවයක් හැඟවෙන බවට වන අදහස ඊට හේතුවයි. මෙහෙකරුවා/වැඩකරුවා-හාම්පුතා වැනි සම්බන්ධතාවයන් වර්තමානයෙහි ලා සලකන විට පසුගාමී සමාජ සම්බන්ධතාවයන් යැයි ඔබ නොසිතන්නේද? ඒ අනුව ගත් විට, මෙවන් පුවත් වාර්තාවන් උදෙසා සේවකයා/සේවිකාව වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima**

See Less